# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1990 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 26/90

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඈඈ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— **262 වන අධිකාරයේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(ඈඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු වුවහොත් ; හෝ ".

**3.** 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) මේ පනතේ පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයක් වෙනුවෙන් ඉදිරිපත් කරන එක් එක් නාමයෝජනා පත්‍රයේ නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් මුළු සංඛ්‍යාවෙන් සියයට හතළිහකට අඩු නොවන සංඛ්‍යාවක් තරුණයන් ගෙන් සමන්විත විය යුතු ය.

(1ආ) එක් එක් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් නාමයෝජනා කරනු ලැබිය යුතු තරුණ අපේක්ෂකයන් සංඛ්‍යාව, කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් නියම කළ යුතු ය. නාමයෝජනා කළ යුතු මුළු තරුණ අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට හතළිහ, පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන්නා වූ සංඛ්‍යාවක් වන අවස්ථාවක, එම පූර්ණ සංඛ්‍යාව සහ භාගයට ආසන්නතම පූර්ණ සංඛ්‍යාව මේ උපවගන්තියේ කාර්ය සඳහා සියයට හතළිහ ලෙස සැලකිය යුතු ය".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ඒ පළාත් පාලන ආයතනය සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතු සභික යන් සංඛ්‍යාවට සමාන වන අපේක්ෂක සංඛ්‍යාවට තුනක් වැඩි සංඛ්‍යාවක් නම් දක්වමින්" යන වචන වෙනුවට, "ඒ පළාත් පාලන ආයතන සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවට සමාන අපේක්ෂක සංඛ්‍යාවට හයක් හෝ ඒ සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක කට සමාන සංඛ්‍යාව යන මෙයින් වඩා අඩු සංඛ්‍යාව එකතු කළ සංඛ්‍යාවක නම් දක්වමින්" යන වචන ආදේශ කරන්න.

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) නාමයෝජනා පත්‍රයේ නම දැක්වෙන සෑම තරුණ අපේක්ෂකයකුගේම උප්පැන්න සහතිකයේ සහතික කල පිටපතක් හෝ තම උපන් දිනය සහතික කරමින් ඒ තරුණ අපේක්ෂකයා විසින් අත්සන් කරන ලද දිවුරුම් පත්‍රයක් ඒ නාමයෝජනා පත්‍රයට අමුනා තිබිය යුතුය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, එහි (4) වන උපවගන්තියේ "තෝරා පත් කර ගනු නොලැබූ අවස්ථාවක සහ, ඒ ස්වාධීන කණ්ඩායම විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව ඒ ඡන්ද විමසීමේ දී දෙනු ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකක් නොඉක්ම වන අවස්ථාවක ඒ කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවෙන් තැන් පත් කරන ලද මුදල්" යන වචන වෙනුවට "තෝරා පත් කර ගනු නොලැබූ අවස්ථාවක ඒ කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. 1983 අංක 48 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) 28 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ නාමයෝජනා කිරීමට නියමිත තරුණ අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව ඇතුළත් කරනු නොලැබූ යම් නාමයෝජනා පත්‍රයක් ; හෝ

(ආආආ) 28 වන වගන්තියේ (4අ) උපවගන්තියෙන් නියමිත පරිදි, තරුණ අපේක්ෂකයකුගේ උප්පැන්න සහතිකයේ සහතික කල පිටපතක් හෝ ඒ තරුණ අපේක්ෂකයා විසින් අත්සන් කරන ලද දිවුරුම් පත්‍රයක් අමුනා නොමැති අවස්ථාවක, ඒ නාම යෝජනා පත්‍රය ; හෝ".

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) නාමයෝජනා කාලසීමාවේ අවසාන දිනයේ මධ්‍යාහ්න දොළහත් අපරභාග එකකුත් තිහත් අතර කාලය ඇතුළත, නාමයෝජනා පත්‍රයක් පිළිබඳ විරෝධතා, තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර ඒ දිනයේ අපරභාග එකකුත් තිහට පසුව එවැනි විරෝධතා කිසිවක් තේරීම් භාර නිලධරයා විසින් භාර ගනු නොලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි "අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් 28 වන වගන්තියේ (1අ) උපවගන්තියේ අන්තර්ගත විධිවිධාන සැලකිල්ලට ගනිමින් යෝජනා කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි "පැහැර හැරියහොත් එවිට—" යන වචන වෙනුවට, "පැහැර හැරියහොත් එවිට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම් ඔවුන් විසින් දක්වා ඇති පරිදි එහෙත් සිංහල අකාරාදී අනුපිළිවෙල අනුව ඇතුළත් තනි ලැයිස්තුවක් තේරීම් භාර නිලධරයා විසින් අප්‍රමාදව පිළියෙල කොට ඉන් අනතුරුව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ (i) වන අනුඡේදයේ "එම නාමයෝජනා පත්‍රයේ පළමුව හා දෙවනුව නම් දැක්වෙන" යන වචන වෙනුවට "එම තනි ලැයිස්තුවේ පළමුව හා දෙවනුව නම් දැක්වෙන" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) ඒ පළාත් පාලන ආයතනයට තෝරා පත් කර ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවට සමාන අනෙක් අපේක්ෂකයන් සංඛ්‍යාවක්, අපේක්ෂකයන්ගේ තනි නම් ලැයිස්තුවේ ඔවුන්ගේ නම් දැක්වෙන අනුපිළිවෙල අනුව, සභිකයන් ලෙස තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශ කළ යුතු ය.".

8. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ, සිංහල අකාරාදී පිළිවෙලින් (අපේක්ෂකයන් විසින්

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

දක්වා ඇති පරිදි) අපේක්ෂකයන්ගේ නම්" යන වචන වෙනුවට "එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම්, ඔවුන් විසින් දක්වා ඇති පරිදි එහෙත් සිංහල අකාරාදී පිළිවෙල අනුව ඇතුළත්, තනි ලැයිස්තුවක්", යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. 1987 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය, එහි (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) ඡන්ද විමසීම තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම්, සිංහල අකාරාදී අනුපිළිවෙලට සකස් කොට, ඒ එක් එක් පක්ෂයේ නමට කෙළින්, ඒ එක් එක් පක්ෂයට වෙන් කර දී ඇති ලකුණ සමග සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ඇතුළත් විය යුතු අතර, ඊට ඉක්බිතිව ම, ඡන්ද විමසීම සඳහා තරග කරන ස්වාධීන කණ්ඩායම් ඇතහොත්, ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන නැවත සඳහන් කොට, අනුක්‍රමික පිළිවෙල අනුව, ඒ එක් එක් කණ්ඩායම සඳහා වූ හඳුනා ගැනීමේ අංකය ද ඒ එක් එක් කණ්ඩායමේ හඳුනා ගැනීමේ අංකයට කෙළින් යොදන ලද ඒ එක් එක් කණ්ඩායමට වෙන් කර දී ඇති ලකුණ ද ඊට පහළින් ම, පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවට හයක් හෝ ඒ සභිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් යන දෙකින් කවර හෝ අඩු සංඛ්‍යාව එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන අංකය හෝ අංක, පේළි එකකට හෝ ඊට වැඩි ගණනකට සිටින සේ අනුක්‍රමික පිළිවෙලට සකස් කර ඇතුළත් විය යුතු අතර, මනාප තුනක් ලකුණු කිරීමට ඉඩ ද සලස්වා තිබිය යුතු ය ; තව ද එම මනාප, අනුක්‍රමික අංකයක් ඇතුළත් කොටු එකක හෝ වැඩි ගණනක හෝ අනුක්‍රමික අංකයක් ඇතුළත් කොටුවකට දකුණු පසින් ඇති හිස් කොටු එකක හෝ වැඩි ගණනක හෝ ලකුණු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය, එහි (6අ) උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) සියලු දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගන්නා ලද මුළු වලංගු ඡන්ද සංඛ්‍යාව, මෙහි මින් මතු "අදාළ ඡන්ද සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.";

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "((අ) ඡේදය යටතේ සුදුසුකම් නොලැබූ පක්ෂ හෝ කණ්ඩායම් හැර) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය" යන වචන වෙනුවට "එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපවගන්තියේ (උ) ඡේදයෙහි "ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයේ ඊළඟට නම දැක්වෙන අපේක්ෂකයා" යන වචන වෙනුවට "38 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පිළියෙල කරන ලද තනි ලැයිස්තුවේ ඊළඟට නම දැක්වෙන අපේක්ෂකයා" යන වචන ආදේශ කිරීමෙන්.

**12.** 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය එහි "ඔහුගේ මනාප දැක්වූයේ යම් අපේක්ෂකයකුට ද" යන වචන වෙනුවට "ඔහුගේ මනාපය හෝ මනාප දැක්වූයේ යම් අපේක්ෂකයකුට ද නැතහොත් අපේක්ෂකයන්ට ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අඅ) 28 වන වගන්තියේ (4අ) උපවගන්තියේ කාර්ය සඳහා දිවුරුම් පත්‍රයක ඇතුලත් යම් ප්‍රකාශයක් අසත්‍ය බව දනිමින් එම දිවුරුම් පත්‍රය අත්සන් කරන ; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය, එහි "තත් කාලයෙහි බල පවත්නා පාර්ලිමේන්තු නාමලේඛනය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

""තරුණයා" යන්නෙන් 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ, ක්‍රියාත්මකව පවත්නා ඡන්දහිමි නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ වූ වර්ෂයේ ජූනි මස පළමුවන දිනට වයස අවුරුදු දහ අටට අඩු නොවූ ද මේ ආඥාපනත යටතේ පැවැත්වෙන සහ අදාළ තැනැත්තා අපේක්ෂකයෙකු වීමට ඉදිරිපත්ව සිටින ඡන්ද විමසීම සඳහා නාමයෝජනා පත් භාර ගැනීමේ කාලසීමාවේ අවසාන දිනයට වයස අවුරුදු තිස් පහට වැඩි නොවූ ද තැනැත්තෙක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

15. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

"පළමුවන උපලේඛනය (28(2) වගන්තිය)

නාමයෝජනා පත්‍රයේ ආකෘතිය

....................... සභාව/ප්‍රාදේශීය සභාව

.............................. මහා නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ සභිකයන් තෝරා පත් කරගැනීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වන ............................ විසින්/(ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායම් නායකයා ............................ වන) ස්වාධීන අපේක්ෂක කණ්ඩායම විසින්/අපේක්ෂකයන් වශයෙන්, පහත නම් සඳහන් තැනැත්තන් මෙයින් නාම යෝජනා කරනු ලැබේ.

I වන කණ්ඩායම — අපේක්ෂකයෝ

| 1. නම | 2. ලිපිනය | 3. වෘත්තිය | 4. අපේක්ෂකයාගේ කැමැත්ත දක්වන අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |

II වන කණ්ඩායම — තරුණ අපේක්ෂකයෝ

| 1. නම | 2. ලිපිනය | 3. උපන් දිනය | 4. වෘත්තිය | 5. තරුණ අපේක්ෂකයාගේ කැමැත්ත දක්වන අත්සන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

මේ නාමයෝජනා පත්‍රයේ නම් දක්වෙන සියලු තරුණ අපේක්ෂකයන්, මේ ආඥාපනතේ 89 වන වගන්තියේ නියමිත වයස් සීමාව ඇතුළත වන බව මම මෙයින් සහතික කරමි.

.............................

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගේ/
කණ්ඩායම් නායකයාගේ අත්සන.

නම : ........................................................

ලිපිනය : ...................................................

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා/කණ්ඩායම් නායකයා වන, ඉහත නම සඳහන් .............................. විසින් 19 ............ ක් වූ .................. මස ............ වන දින වූ මෙදින ................................ දී මා ඉදිරිපිට අත්සන් තබන ලදී.

..........................................
සමාදාන විනිශ්වයකාරවරයා හෝ
ප්‍රසිද්ධ නොතාරිස්වරයා".

16. 1987 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, එහි "තුන් දෙනෙකුට නොවැඩි අපේක්ෂකයන් ගණනකට ඇති තම මනාප" යන වචනවල සිට "(මෙසේ "X" කතිරයක් ගැසීමෙන් දැක්විය යුතු ය.)" යන වචන තෙක් ඇති වචන වෙනුවට "තුන් දෙනෙකුට නොවැඩි අපේක්ෂකයන් ගණනකට ඇති තම මනාප දැක්වීම, ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොට එකක හෝ වැඩි ගණනක හෝ ඒ අනුක්‍රමික අංකයක් ඇතුළත් කොටුවකට දකුණු පසින් ඇති හිස් කොටු එකක හෝ වැඩි ගණනක හෝ (මෙසේ "X") කතිරයක් හෝ තුනකට නොවැඩි කතිර සංඛ්‍යාවක් යෙදීමෙන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

17. 1987 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

" තුන්වන උපලේඛනය

ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස ආකෘතිය

| | | |
|---|---|---|
| උප පත්‍රිකා අංකය | " අ " පක්ෂය | ලකුණ |
| | " ආ " පක්ෂය | ලකුණ |
| | "ඇ" පක්ෂය | ලකුණ |
| | " ස්වාධීන කණ්ඩායම " 1 | ලකුණ |
| | " ස්වාධීන කණ්ඩායම " 2 | ලකුණ |
| | " ස්වාධීන කණ්ඩායම " 3 | ලකුණ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 28 | | |
| 2 | | | 29 | | |
| 3 | | | 30 | | |
| 4 | | | 31 | | |
| 5 | | | 32 | | |
| 6 | | | 33 | | |
| 7 | | | 34 | | |
| 8 | | | 35 | | |
| 9 | | | 36 | | |
| 10 | | | 37 | | |
| 11 | | | 38 | | |
| 12 | | | 39 | | |
| 13 | | | 40 | | |
| 14 | | | 41 | | |
| 15 | | | 42 | | |
| 16 | | | 43 | | |
| 17 | | | 44 | | |
| 18 | | | 45 | | |
| 19 | | | 46 | | |
| 20 | | | 47 | | |
| 21 | | | 48 | | |
| 22 | | | 49 | | |
| 23 | | | 50 | | |
| 24 | | | 51 | | |
| 25 | | | 52 | | |
| 26 | | | 53 | | |
| 27 | | | 54 | | |

18. ප්‍රධාන ප්‍රඥප්තියේ නවවන උපලේඛනය එහි නියෝගවල උපලේඛනයේ දැක්වෙන "ආකෘතියේ පිටිපස" යන ශීර්ෂය යටතේ පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ නවවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) "අ" ඡේදයේ 3 වන අනුඡේදයේ "අපේක්ෂකයන් 3 දෙනෙකුට නොවැඩි" යන වචනවල සිට එම අනුඡේදයේ අවසානය තෙක් ඇති කොටස වෙනුවට, "අපේක්ෂකයන් තුන් දෙනෙකුට නොවැඩි ගණනක් සම්බන්ධව සිය මනාප දැක්වීම, ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොටු එකක හෝ වැඩි ගණනක හෝ ඒ අනුක්‍රමික අංක යක් ඇතුළත් කොටුවකට දකුණු පසින් ඇති හිස් කොටු එකක හෝ වැඩි ගණනක හෝ (මෙසේ "X") කතිරයක් හෝ කතිර යෙදීමෙන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ආ" ඡේදයේ 4 වන අනුඡේදයේ "අපේක්ෂකයන් 3 දෙනෙකුට නොවැඩි" යන වචනවල සිට ඒ අනුඡේදයේ අවසානය තෙක් ඇති කොටස වෙනුවට "අපේක්ෂකයන් තුන් දෙනෙකුට නොවැඩි ගණනක් සම්බන්ධව සිය මනාප දැක්වීම ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොටු එකක හෝ වැඩි ගණනක හෝ ඒ අනුක්‍රමික අංක යක් ඇතුළත් කොටුවකට දකුණු පසින් ඇති හිස් කොටු එකක හෝ වැඩි ගණනක හෝ (මෙසේ "X") කතිරයක් හෝ කතිර යෙදීමෙන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

19. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවුවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.